# මැටි කර්මාන්තය

- ## ශ්‍රී ලංකාවේ පාරම්පරික මැටි කලා කර්මාන්තය


- සෑම පුරාතන ශිෂ්ටාචාරයක පාහේ ඉපැරණි කර්මාන්තයක ලෙස මැටි කලා කර්මාන්තය පැවති බවට පුරාවිද්‍යාත්මක සාධක පවතී.
- ශ්‍රී ලංකාවේ ද මෙගලිතික සුසාන භූමි ආශ්‍රිත ව එනම් ක්‍රිස්තු පූර්ව 600ට පෙර කාල නිර්ණය කරන ලද මැටි භාණ්ඩ රාශියක් හමු වී තිබේ.
- යාපනය කන්තරෝඩය, අනුරාධපුර, පොළොන්නරුව සහ මහනුවර වැනි ස්ථානවල කරන ලද කැනීම් අනුව පුරාතන සාම්ප්‍රදායික මැටි භාණ්ඩ රාශීයක් හමු වී ඇත.
- මැටි භාණ්ඩ නිර්මාණය කිරීම සඳහා ලංකාවේ සෑම පළාතක ම කෙයොලින් මැටි, රතු මැටි සහ කහ පැහැති මැටි ද භාවිත කොට තිබේ. මේ අතරින් කෙයොලින් මැටි වඩාත් ගුණාත්මක බවින් යුක්ත වේ.
- මැටි භාණ්ඩ සකස් කර ගැනීමට පෙර ගල්, වැලි හා රොඩු ආදිය ඉවත් කරමින් මැටි පදම් කරගනු ලැබේ. මේ සඳහා සාම්ප්‍රදායික ව මැටි පයින් පාගා පදම් කරගනු ලබන අතර වර්තමානයේ යන්ත්‍රානුසාරයෙන් ද මැටි අඹරා සකස් කරගැනීම සිදු කරනු ලැබේ.

- ## නිර්මාණය කරනු ලබන භාණ්ඩ වර්ග

1. ගෘහාශ්‍රිත භාණ්ඩ - කලය , මුට්ටිය , ඇතිලිය , නෑඹිලිය , මූඩිය , කොරහ , බත් වළඳ ( මැටි කෝප්පය ) , පැන් තාලිය ගුරුලේත්තුව , ඌරා කැට ළින්

( උරා කැට - මේ ළිං උඩරට ප්‍රදේශවල බෙහෙවින් දක්නට ලැබේ . හැඩයෙන් වෘත්තාකකාරය . විශ්කම්භය අඩි 3 ක් පමණි . මෙහි වට බැම්ම ගලින් බඳිනු වෙනුවට උරා කැට ළිං පතුලේ සිට යොදනු ලැබේ . ළිං පතුලේ විශ්කම්භය ක්‍රමයෙන් විශාල වෙයි . )

2. ආගමික කටයුතු හා උත්සව භාණ්ඩ - කොතලය , බුම්මැඩිය, පූනාව, පහන්, පාත්‍රා, හලඹ
3. ඉදි කිරීම් ද්‍රව්‍ය - උළු හෙවත් වඩිම්බු උළු ,විශේෂ උළු වර්ගයකි . පෙති උළු , කොත් , ගඩොල් , පිහිලි, නළ





i ii iii iv - පැතලි වහල උළු

vii viii - මුදුන් උළු කැටයක හැලැස්ම හා හරස් කැපුම

ix - අලංකරණ යෙදූ අර්ධ සිලින්ඩරාකාර මුදුන් උළක සැලැස්ම

උඩරට වඩිම්බු උළු , බෝ කොළ හැඩය




4. සාම්ප්‍රදායික නිර්මාණය වු මැටි භාණ්ඩ වර්ග - හැළි , කොත් කැරළි

5. කර්මාන්ත ආශ්‍රිත භාණ්ඩ - ගිනි කබල , උදුන, කෝව

**මැටි භාණ්ඩ නිෂ්පාදනය :-**

වර්තමාන ශ්‍රී ලංකාවේ ශිල්ප ක්‍රම 3 ක් යටතේ මැටි භාණ්ඩ නිෂ්පාදනය කරයි .

1) පා සකපෝරුව භාවිතයෙන්

2) අත් සකපෝරුව භාවිතයෙන්

3) මැටි වළලු සහ මැටි පුවරු උපයෝගි කොටගෙන භාණ්ඩ ඉදි කිරීම, ඇඹීමෙන් සහ නෙළීමෙන්

## අත් සකපෝරුව භාවිතයෙන්






- ශ්‍රී ලංකාවේ ඉපැරණි ම තාක්ෂණික ක්‍රියාවලිය ලෙස අත් සකපෝරුව භාවිතයෙන් මැටි භාණ්ඩ නිර්මණය කළ බවට සාධක පවතී. සාම්ප්‍රදායික මැටි කර්මාන්තය සඳහා බහුල ව ම භාවිත වී ඇත්තේ මෙම ක්‍රමය යි.
- මේ සඳහා අඩි දෙකක් හෝ දෙකහමාරක් හෝ විෂ්කම්භය ඇති දැව හෝ කළුගල් හෝ භාවිතයෙන් සාදන ලද වෘත්තාකාර පුවරුවක් භාවිත කෙරේ. මෙය පොළොවේ සිට අඟල් හයක් පමණ සිටින සේ කුඩා ගල් කණුවක සිටුවාගනු ලැබේ.
- ඒ මත පදම්කරගත් මැටි තබා එකින් එක භාණ්ඩ නිර්මාණය කර ගනී. සකපෝරුව දෙ පස දෙ දෙනකු වාඩිවී සිටින අතර, එක් අයෙකු සකපෝරුව කරකවන විට අනෙක් පස සිටින තැනැත්තා විසින් භාණ්ඩ ඉදි කරනු ලැබේ.
- මෙ සේ නිර්මාණය කරගනු ලබන මැටි භාණ්ඩ නූලක ආධාරයෙන් කපා ඉවත් කරගනු ලබන අතර, ඒවා මඳක් වියළුණු පසු ඔප මට්ටම් කරගත් වෘත්තාකාර කළුගල් පුවරුවක් සහ දැවයෙන් සාදනු ලැබූ පත්ත නැමති උපකරණයක් භාවිතයෙන් මෙම භාණ්ඩවල යට කොටස (පල්ල) තනාගනු ලැබේ.
- අත් සකපෝරුව භාවිතයෙන් ඉතා විශාල භාණ්ඩ පහසුවෙන් නිර්මාණය කරගත හැකි වේ.

## පා සකපෝරුව භාවිතයෙන්




- මෙම ක්‍රමය නූතනයේ දී භාවිතයට පැමිණ ඇත. සිටගෙන භාණ්ඩ තැනීමට හැකිවීම, පාදය භාවිත කොට සකපෝරුව කරකැවීමට හැකිවීම සහ අවශ්‍ය නම් විදුලියෙන් ක්‍රියාත්මක කරවීමට හැකිවීම මෙම පා සකපෝරුවේ ඇති විශේෂතා වේ.
- මෙම ක්‍රමයේ සකපෝරු, පොළොවේ සිට අඩි තුන හමාරක් පමණ උසට ලෝහ හෝ දැව හෝ භාවිතයෙන් සාදනු ලැබේ.
- මෙම ක්‍රමය භාවිතයෙන් මල් පෝච්චි, කැට, කුඩා පහන්, ගුරුලේත්තු සහ කුඩා ප්‍රමාණයේ විසිතුරු භාණ්ඩ නිර්මාණය කරනු ලැබේ.

3 මැටි වළලු සහ මැටි පුවරු උපයෝගි කොටගෙන භාණ්ඩ ඉදි කිරීම, ඇඹීම සහ තෙළීම

- මැටි බිත්ති පුවරු, කැටයම් පුවරු, කොත් කැරලි, කුඩා මැටි පිළිම, උඟුරා කැට ළින්, පූනාව, වැනි භාණ්ඩ නිර්මාණයේ දී මෙම ක්‍රම භාවිත කෙරේ.





**භාණ්ඩ පිළිස්සීමේ තාක්ෂණය**

- මූල් වකවානුවේ දී මැටි බඳුන් මත පිදුරු දමා ඒ මත මැටි තට්ටුවක් අතුරා පුළුස්සා ගනු ලැබේ. අනතුරුව පුලුස්සන ලද මැටි බඳුන් තවදුරටත් ශක්තිමත් කර ගැනීම සඳහා නැවතත් ඒවා මත දහයියා හා මැටි අතුරා පිළිස්සීමට ලක් කෙරේ.
- පසුකාලීනව මේ සඳහා ගඩොළු සහ මැටි භාවිතයෙන් සකස් කොටගත් ඉතා සරල පෝරණුවක් භාවිත විය.
- පෝරණුව තුළ වළන් අතුරා, පොල් ලෙලි යොදා එක් දිනක් පිළිස්සීමෙන් පසු ව, දර එකතු කොට සෙන්ටි ග්‍රේඩ් අංශක 600ක පමණ උෂ්ණත්වයක් යටතේ පැ 12ක පමණ කාලයක් භාණ්ඩ පුලුස්සා ගනු ලැබේ.







මැටි මාධ්‍ය සඳහා ප්‍රචලිත ව පැවති ප්‍රදේශ - කැලණිය , මාතලේ , හංවැල්ල , කඩුවෙල, රත්කපුරය . කොස්ලන්ද , ගම්පහ, වේයන්ගොඩ හොරණ, මහනුවර ,දුම්බර ,කළුතර,කණ්ඩාවලෙයි, ඔට්ටු සුට්ටාන්, නෙඩුංකේනි, පුදුක්කුඩියිරුප්පු, මුරුංගන්

**භාණ්ඩ අලංකරණ තාක්ෂණය**

- තෙත මැටි බඳුනේ සායම් යොදාගෙන මෝස්තර ඇඳීම
- අච්චු අලංකරණ
- පිලිස්සූ බඳුනේ සායම් යොදා මෝස්තර ඇඳීම
- අව්වේ වියලන ලද මැටි බඳුනේ උල් වූ යකඩ උපකරණයක් මගින් මෝස්තර ඇඳීම
- දිස්නය ලබා ගැනීම සඳහා ආලේපන යොදා ගැනීම

- මෙම මෝස්තර යෙදීමේ දී සුළිය, සුළි දෙක, දියරැළි, හවඩිය, පනාව, පලාපෙති, තනිපට ලණුව, දෙපට ලණුව, ලියවැල්, භේරුණ්ඩ පක්ෂියා , බෝපත්, කතිරමල, හංසයා සහ සිංහයා බහුල ව යොදා තිබේ.






A , B සරල සැරසිලි

C මල් ( නෙලුම් මල් සමග )

D මල ( නෙලුම් ) හා බෝ කොළ





**නූතනයේ මැටි කලා කර්මාන්තය පවත්නා ප්‍රදේශ**

කැලණිය - නවගමුව, රණාල
කෑගල්ල - මොලගොඩ
අනුරාධපුරය - රඹෑව
මහනුවර - වළල
කුරුණෑගල - පඬුවස් නුවර, පිදුරුවැල්ල, කලුගමුව
මාතර - කපුගම, බෙලිඅත්ත, යටියන, කිරින්ද,
කළුතර - දෙදියවෙලම්,
කිලිනොච්චිය - ධර්මපුර, විසුවමඩු
මුලතිව් - පුදුක්කුඩියිරුප්පු, මුල්ලියවලෙයි
මන්නාරම - නාච්චික්කුඩා, මඩුක්කරෙයි
යාපනය - කල්වියංකාඩු, කොඩිකාමම්, සංගානෙයි
වවුනියාව - නොච්චිකාමම්
මඩකලුව - එරාවුල්, කලවාංජික්කුඩි, පෙරියපොරතිව්